**අවසාන වාර පරීක්ෂණය - 2017**
**ක්‍රිස්තියානි ධර්මය**
**09 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## I කොටස

01. (3) උත්පත්ති 12 පරිච්ඡේදයේ සිට ය.
02. (2) සාවුල් ය.
03. (2) කාර්මේල් කන්දේ දී ය.
04. (3) රජතුමා යහපත් පාලනයක් තුළ ජනතාව ආරක්ෂා කිරීම හා ජනතාවට මැනවින් සේවය කිරීම. ඒ තුළින් රජතුමා ආරක්ෂා වීම.
05. (3) දේව ගුණාංගයන් ගෙන් යුක්ත වීම
06. (3) පාස්කු මංගල්‍යය මගිනි.
07. (2) බුද්ධිය
08. (1) ආලෝකය හා විමුක්තිය
09. (3) ජෙරිකෝව
10. (3) දිවැසිවරුන් ය.
11. (2) ජොහාන්, පේදුරු, ජාකොබ්
12. (2) ජෝන් නිව්ටන්
13. (1) මාටින් ලූතර් කිං (3) මහත්මා ගාන්ධි
14. (2) යෙසායා
15. (3) ජෙරමියා
16. (2) ආමොස්
17. (1) සෙඩෙක් ආයතනය
18. (3) 13 කි.
19. (1) ජෝන් වයික්ලිප්
20. (1) අගපේ (ලකුණු 2X20=40)

## II කොටස

01. (i) උත්පත්ති 1-11 පරිච්ඡේද (ලකුණු 2)
(ii) විශ්වය මැවීම, ආදම් සහ ඒව, කායින් සහ ආබෙල්, නෝවා හා ජල ගැල්ම, බාබෙල් කොත (ලකුණු 3)
(iii) සර්ව බලධාරී දෙවිඳුන්ට හිමි ගෞරවය ලබා දීම, දේව කැමැත්තට අනුකූලව ජීවත් වීම ආදී කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

02. (i) ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, ආත්ම දමනය (ලකුණු 2)
(ii) එම ජනතාවට යහපත් දිවි පෙවතක් ගත කිරීම සඳහා නිවැරදි මග පහදා දීම (ලකුණු 3)
(iii) ඇදහිල්ල ජීවිතයේ පදනම විය යුතුය,
දෙවියන් වහන්සේ සමග සමීප සබඳතාවක් ඇති කර ගත යුතුය,
ලෞකිකත්වයට ගැති නොවිය යුතුයි.
ගැටුම් ආරවුල් ඇති කර නොගත යුතුයි.
තරගකාරිත්වයෙන් තොරව කටයුතු කළ යුතුයි.
ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

03. (i) දේව නිර්මාණය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම
දෙවියන් වහන්සේට ආදරය කිරීම
උන්වහන්සේ මහිමයට පත්වන පිණිස දේව මැවිල්ල පාලනය කිරීම
සාධාරණව නිසි ලෙස බෙදා ගැනීම (ලකුණු 2)

(ii) විමුක්තිය අත්දුටු ජනතාව පොරොන්දු දේශයේ සම්පත් හඳුනා ගෙන තමන්ගේ හා දිළිඳුන්, වැන්දඹුවන්, අසරණයන්ට පිහිට වීම (පිටු අංක 28)

මැවිල්ලේ සම්පත් සාධාරණව බෙදා ගත් බව ලෙවී ව්‍යවස්ථාවේ සඳහන් ව ඇත. ලෙවී 19:9-10 (පිටු අංක 29)

සම්පත් සියල්ල විකුණා පොදුවේ තබා ගැනීම (ක්‍රියා 2:44-46) (ලකුණු 3)

(iii) නව තාක්ෂණය තුළින් කෘෂිකර්මාන්තයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර බීජ වර්ග, රසායන ද්‍රව්‍ය හඳුන්වා දීම

සන්නිවේදනය තුළින් ජංගම දුරකථන, ඊමේල් තාක්ෂණය, ෆැක්ස් යන්ත්‍ර යොදා ගැනීම

ගමනා ගමනය සඳහා

වෛද්‍ය විද්‍යාව සඳහා ආදී කරුණු විස්තර කර ඇත්නම් ලකුනු ලබා දෙන්න. (ලකුණු 5)

04. (i) තෙරේසා මව්තුමිය, මාටින් ලූතර් කිං (ලකුණු 2)

(ii) තෙරේසා මව්තුමිය - 1914 අගෝස්තු මස 26 දින උපත ලැබීය. වයස අවුරුදු 12 දී ධර්මදූතවරියක් වීමට බලාපොරොත්තු වීම, ඒ අනුව අවුරුදු 18 දී ලොරෙටෝහි කන්‍යා සොයුරියන් වෙතට යාම, වසර 17ක් කල්කටාවේ පාසලක ඉගැන්වීම, දයාවේ සේවාව නමින් සේවය ඇරඹීම ...

මාටින් ලූතර් කිං - 1929 ජනවාරි උපත ලැබීම, මුල් නම මයිකල් ලූතර් කිං විය. පසුව නම මාටින් ලූතර් කිං ලෙස වෙසත් කිරීම, අසරණ ජනතාව වෙනුවෙන් අවිහිංසා වාදය තුළ ක්‍රියා කිරීම. (ලකුණු 3)

(iii) අන් අයට උදව් උපකාර කිරීම, සාධාරණව කටයුතු කිරීම, කරදරයට පත් වූ අයට පිහිට වීම, තමන්ට ඇති දේවල් අන් අය සමග බෙදා ගැනීම ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

05. (i) එකම දෙවිඳුන්ගේ ආධිපත්‍යයට කීකරුව, පක්ෂපාතිව, නිහතමානිව, යටත් වන මානව වර්ගයගෙන් සැදුම්ලත් රාජ්‍යයකි. (ලකුණු 2)

(ii) දිළිඳුකම, නිහතමානිකම, දයාවන්තකම, ශුද්ධවන්තකම, යුක්තියට කැපවීම, සාධාරණයට වැය වීම, සාමයට දායක වීම. (ලකුණු 3)

(iii) මානව දයාව හීන වීම තුළ සාරධර්ම පිරිහීම

අදේව දෘෂ්ටිය, ප්‍රචන්ඩත්වය, කප්පම් ව්‍යාපාර, මත්ද්‍රව්‍ය වැනි ආපදාවන්ට මුහුණ දීම ආදී කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

06. (i) දෙවියන් වහන්සේ හා මිනිසා අතර සබඳතාවය යි. (ලකුණු 2)

(ii) උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය (ලකුණු 3)

(iii) විවිධ ගැටළුවලට පිළිතුරු සඳහන්ව තිබීම, උපදෙස් ඇතුළත්ව තිබීම, දෙවියන් වහන්සේ බයිබලය තුළින් අපට කථා කරන බව ආදී කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

07. (i) මාටින් ලූතර්

තාපස පූජක තුමෙකි. ජර්මනියේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය දියත් කිරීමට මූලික විය. හෙබ්‍රෙව් පැරණි ගිවිසුම හා ග්‍රීක නව ගිවිසුම යොදා ගනිමින් බයිබලය ජර්මන් බසට පරිවර්ථනය කරන ලදි.

(ii) ශු. ජෙරොම්

ක්‍රි.ව. 345-420 කාලයේ ජීවත් වූ තාපස පූජකතුමෙකි. පැරණි ගිවිසුම ලතින් බසට පරිවර්ථනය කරන ලදි. හෙබ්‍රෙව් පිටපත් ලතින් බසට පරිවර්ථනය කිරීමට උත්සහ ගත් අයෙකි.

(iii) ජෝන් වයික්ලිෆ්

බුද්ධිමත් පූජකයෙකි. ලතින් බයිබලය ඉංග්‍රීසි බසට පරිවර්ථනය කරන ලදි. සාක්ෂරතාව අඩු ගැමි ජනතාවට ශුද්ධ ලියවිලි පහදා දීමට කටයුතු කළේ ය.

(iv) විලියම් ටින් ඩේල්

ඉංග්‍රීසි පූජකතුමෙකි. ශු. බයිබලය ඉංග්‍රීසි බසට පරිවර්ථනය කිරීම. 1526 නව ගිවිසුම ඉංග්‍රීසි බසින් මුද්‍රණය කිරීම

(v) ශ්‍රී ලංකා බයිබල් සංගමය

කොලලුපිටියේ අංක 293 හි පිහිටා ඇත. බයිබල් සමාගම ආරම්භ කර වසර 200ක් ගත ව ඇත. අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ ජීවත් වන සියලු ජනතාවට දේව වචනය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම යි. මෙහි සේවය ශුද්ධ ලියවිලි පරිවර්ථනය, ප්‍රකාශනය, බෙදා හැරීම සහ ජීවිතයට අදාළ කර ගැනීමට උපකාර කිරීම මෙහි ඉලක්කය වන්නේ සෑම සිවසකටම ශු. බයිබලයක් ලබා දීම. සෑම කිතුනුවෙකුටම නව නව ගිවිසුමක් ලබා දීම හා සෑම අයෙකුටම ශුද්ධ ලියවිලි කොටසක්වත් ලබා දීම යි. (ලකුණු 5X2=10)